ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

ප්‍රසම්පාදන දැන්වීමයි.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ඇහැලියගොඩ, දම්මුල්ල, ගැටහැත්ත හා පලීගල යන මහජන පුස්තකාල සඳහා පුස්තකාල පරිපාලන මෘදුකාංග පද්ධති ස්ථාපනයට, අදාළ සේවා ආයතන මගින් මිල ගණන් කැඳවනු ලැබේ.

01. මිල ගණන් භාරගන්නා අවසන් දිනය - 2026.11.17 පෙ.ව.10.00 දක්වා
02. මිල ගණන් විවෘත කිරීම - 2026.11.17 පෙ.ව.10.00ට

කොන්දේසි

1. ලබාදෙන සේවාවන් පිළිබඳ විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන්) ලබාදිය යුතුය.
2. ව්‍යාපෘති වාර්තාව අප විසින් ලබාදෙන පිරිවිතරයන්ට අනුකූල විය යුතුය.
3. මිල ගණන් සහිත ව්‍යාපෘති වාර්තාව ‘‘සභාපති, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව’’ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.
4. මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

පිරිවිතර පිළිබඳ විස්තර කාර්යාල වෙබ් අඩවිය මගින් ලබාගත හැක.
www.eheliyagoda.ps.gov.lk

වැඩි විස්තර සඳහා
දුරකථන අංකය 036-2258012
036-2258014

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2026.10.29

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සඳහා පුස්තකාල පරිපාලන මෘදුකාංග පද්ධති ස්ථාපනය සඳහා පිරිවිතර

1. ආයතනයේ ලියාපදිංචිය පිළිබඳ විස්තර

2. මෘදුකාංග පද්ධතියේ නවතම සංස්කරණය (Newest Stable Version) ස්ථාපනය කිරීම.

3. පුස්තකාලයේ ප්‍රතිපත්ති සහ අවශ්‍යතා අනුව පද්ධතිය සැකසීම. (Customization)

4. පුස්තාකාලයේ අවශ්‍යතාවයන් අනුව පද්ධතිය මඟින් වාර්තා සැකසීම. (Reports generation)
(නිද: - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා)

5. පුස්තකාලය වෙත පැමිණ (Onsite) සහ දුරස්ථව (Remote) සේවාවන් ලබාදීම.

6. පුස්තකාල පරිපාලන පද්ධතිය භාවිතයෙන් පුස්තකාල කටයුතු පවත්වාගෙන යාමේදී හටගන්නා දෝෂ සහ එම ගැටළු නිරාකරණය සඳහා පැය 24 පුරා, සතියේ දින 7 තුළ තාක්ෂණික සහාය උපදේශකත්ව සහාය සහ පද්ධති නඩත්තු සේවාවක් ලබා ගැනීම. (ගිවිසුම්ගත කාලය තුළදී)

7. සුචිකරණය (cataloging), පාඨක (Patron Management), සංසරණ (Circulation) මොඩියුල සහ පද්ධතියේ නව ප්‍රවණතා පිළිබඳ කාර්යය මණ්ඩල පුහුණුව.

8. සේවාදායක පරිගණකයේ මෙහෙයුම් පද්ධතියේ ආරක්ෂාව තහවුරු කරගැනීම.

9. Backups පද්ධතිය ස්ථාපනය කිරීම.

10. **වලාකුළු පරිගණක යටිතල පහසුකම් (Cloud Infrastructure)** - අවම වශයෙන් vCPU 4ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්, RAM මතකය 8 GB–16 GB, අවම වශයෙන් 100 GB අධිවේගී SSD ගබඩා ඉඩකඩක් පැවතීම.

11. **ආරක්ෂාව සහ දත්ත උපස්ථ (Security & Backups)** - Let's Encrypt මඟින් ලබාගන්නා SSL/TLS සංකේතනය සහිත HTTPS ආරක්ෂිත සම්බන්ධතාව, කළමනාකරණය කරන ලද Firewall ආරක්ෂණ පද්ධතිය සහ දිනපතා ස්වයංක්‍රීයව වෙනත් ස්ථානයක ගබඩා කරන දත්ත සමුදා උපස්ථ (Offsite Database Backups).

12. **OPAC පද්ධතිය සහ අභිරුචිකරණය (OPAC & Customization)** - ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අනන්‍යතාවයට ගැළපෙන පරිදි සකස් කළ, ජංගම දුරකථනවලට ප්‍රතිචාරාත්මක (Mobile-Responsive) මාර්ගගත පුස්තකාල නාමාවලියක් ස්ථාපනය කිරීම. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන්ම භාවිත කළ හැකි අතුරුමුහුණතක් ඇතුළත් විය යුතුය.

13. **ස්වයංක්‍රීය දැනුම්දීම් (Automated Notifications)** - SMTP Relay පහසුකම සකස් කර, පොත් නිකුත් කිරීමේදී, නැවත භාරගැනීමේදී, ආපසු භාරදිය යුතු දිනයට පෙර සහ ප්‍රමාද වූ පොත් සඳහා නැවත නැවත දැනුම්දීම් යැවීමේ විද්‍යුත් තැපැල් පද්ධතියක් ස්ථාපනය කිරීම. අදාළ ප්‍රමාද ගාස්තු ස්වයංක්‍රීයව ගණනය කර දැනුම්දීමේ විස්තරවලට ඇතුළත් කළ යුතුය.

14. **පාඨක පැමිණීම සටහන් කිරීමේ පද්ධතිය (User Attendance System)** - පාඨකයන්ගේ තීරුකේත (Barcode) භාවිතය හා පාඨක දත්ත සමුදාය (Patron Database) සමඟ ඒකාබද්ධ කිරීම.

15. **දත්ත සංක්‍රමණ සේවා (Data Migration Services)** - දැනට පවතින පුස්තකාල නාමාවලියේ දත්ත පිරිසිදු කිරීම, උපුටා ගැනීම සහ නව පද්ධතියට ගැළපෙන පරිදි සැකසීම.